# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## උතුරු පළාත

පළාත් මට්ටමේ අවසාන පොදු වාර පරීක්ෂණය -2014

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**I කොටස**

ශ්‍රේණිය 11 | කාලය පැය 1යි

විභාග අංකය ..................................... | ලකුණු

- ❖ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ❖ **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි පිළිතුර තෝරා අදාළ අංකය සහිත කවය තුළ (x) ලකුණ යොදන්න.ඳ**

---

- **අංක 01 - 03 දක්වා ඇති එක් එක් වාක්‍යයන්ගේ ඉරිඇඳි කොටසේ අදහසට වඩාත් සමීප අදහස තෝරන්න.**

**(01)** අන් අයගේ වැඩ කටයුතු වලට <u>අකුල් හෙළීම</u> ඇතමුන්ගේ සිරිතකි.
**(1) කැළෑ එළිකිරීම** **(2) බාධා කිරීම** **(3) එකට එක කිරීම** **(4) අනුබල දීම**

**(02)** විචාර සිද්ධාන්ත මත යම් සාහිත්‍ය ග්‍රන්ථයක් <u>විචාරයට ලක්කළ</u> යුතු වුවද එම ග්‍රන්ථයේ අස්කොන් සෙවීම සම්ප්‍රදායට පටහැනි යැයි විචාරකයෝ පවසති.
**(1) හතර මුල්ල සෙවීම** **(2) උස් මිටි භේද සෙවීම**
**(3) විස්තරාත්මක කරුණු සෙවීම** **(4) සුළු සුළු වැරදි සෙවීම**

**(03)** ආයතනයේ කවර වැඩක දී වත් <u>කරනාරින</u> සේවකයෝ වර්ෂ අවසානයේ දිරිදීමනා ලැබූහ.
**(1) බර වැඩ කරන** **(2) පිටු නොපාන** **(3) කීකරුව සිටින** **(4) අලස නොවන**

- **අංක 04 සිට 08 තෙක් එක් එක් වාක්‍යයේ හිස්තැන සඳහා වඩාත් සුදුසු පදය තෝරන්න.**

**(04)** කවියාගේ නිර්මාණයට පාදක වූ .................. නිර්ව්‍යාජය
**(1) ප්‍රතිභාව** **(2) අනුභූතිය** **(3) ව්‍යුත්පත්තිය** **(4) ප්‍රඥාව**

**(05)** උතුරු මුහුදේ ඛනිජ තෙල් ....... කටයුතු සඳහා විදේශ සමාගම් කිහිපයක් රජයට සහයෝගය දක්වයි.
**(1) ගවේෂණ** **(2) විමර්ශන** **(3) ආදේශන** **(4) විචක්ෂණ**

**(06)** තීරු ලිපිවලට යොදා ඇත්තේ .................. බස් වහරයි.
**(1) දීර්ඝ කාලීන** **(2) කෙටි කාලීන** **(3) සම කාලීන** **(4) සර්ව කාලීන**

**(08)** ක්‍රිකට් කණ්ඩායම් ජයග්‍රහණයෙන් .................. ක්‍රීඩකයෝ ඔල්වරසන් දුන්හ.
**(1) පුදුම වුණු** **(2) විපරීත වුණු** **(3) උදම් වුණු** **(4) උදහස් වුණු**

**(08)** චතුර නිවේදකයා නිතරම.................. ප්‍රතිචාර පිළිබඳ සැලකිලිමත් වේ.
**(1) ශ්‍රාවක** **(2) ප්‍රේක්ෂක** **(3) සහෘද** **(4) ලේඛක**

- **අංක 09 සිට 11 තෙක් එක් එක් පද යුගලයෙන් දෙවන පදය පළමුවැන්නට අර්ථයෙන් සමාන වේද, විරුද්ධ වේද අර්ථය වැඩිකරයිද , වෙනස් අර්ථයක් දේද යන්න තෝරන්න.**

**(09)** ආකුල - නිරාකුල **(1) සමාන** **(2) විරුද්ධ** **(3) වැඩි** **(4) වෙනස්**

**(10)** පුල් - සුපුල් **(1) සමාන** **(2) විරුද්ධ** **(3) වැඩි** **(4) වෙනස්**

**(11)** අශ්ව- සෛන්ධව **(1) සමාන** **(2) විරුද්ධ** **(3) වැඩි** **(4) වෙනස්**

- **අංක 12 -13 තෙක් ප්‍රශ්නවල ඇති වාක්‍ය අතරින් හැම පදයක්ම අක්ෂර වින්‍යාසය නිවැරදි වන වාක්‍ය තෝරන්න.**

**(12)** **(1) පෞරාණික අනුරාධපුර නගරයේ නෂ්ඨාවශේෂ සංචාරකයන්ගේ සිත් ඇද ගනියි.**
**(2) ලංකාවේ ශේෂ්ටතම පූජනීය බෞද්ධ නගරය අනුරාධපුරයයි.**
**(3) අනුරාධපුර නගරය ඓතිහාසික වටිනාකමින් අනූනය.**
**(4) රුවන්වැලි මහා ස්ථූපය අනර්ග නිර්මාණයකි.**

(13) (1) මහාවන්සයෙහි සඳහන් පරිදි විජය රජ්ජුරුවෝ ලංකාවේ පලමු රජතුමා විය.
(2) දුටුගැමුණු රජ්ජුරුවෝ අවුරුදු තිස් අටක් වෑයම් කලේ සමස්ථ ලංකා ද්වීපයම එක් සේසත් කිරීමටයි.
(3) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ වළගම්බා රාජ්‍ය සමයෙහිය.
(4) දක්ෂ වෛද්‍යවරයෙක් වූ බුද්ධදාස රජ්ජුරුවෝ දේශීය ඖෂධ මඟින් රෝගීහු සුවපත් කළහ.

- අංක 14 සිට 15 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයේ මුලින් යෙදී ඇති පදයේ නිවැරදි විසන්ධිය තෝරන්න.

(14) ජාත්‍යානුරාගය
(1) ජාති + අනුරාගය (2) ජාතික + අනුරාගය (3) ජාති + කානුරාගය (4) ජාතික + අනුරාගය

(15) පියුමුපුල්
(1) පියුම් + උපුල් (2) පියම් + උපුල් (3) පිය + උපුල් (4) පිය + මුපුල්

(16) "එතර දිනිඳු හිමි දැක විලඹුවෝ හැමා " යන පද්‍ය පාඨයෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?
(1) එතර සූර්යයා දැක ගැනීමට ආශාවෙන් සිටින බවයි.
(2) විල් නැමති අඹුවෝ සූර්යයා නැමති හිමියා දැක ගැනීමට ආශාවෙන් සිටින බවයි.
(3) එතරට සූර්යයා පායා ඇති බවයි.
(4) විලට සූර්යයා අමුත්තකු බවයි.

- එක් එක් වරණයෙහි පද තුනක් හා ඒවායේ තේරුම් දී ඇත. තේරුම වරදවා ඇති පදයක් සහිත වරණය තෝරන්න.

(17) (1) පර්ෂදයට - පිරිසට, පුරාකෘත - පෙර කරන ලද, අභිමුඛ - මුහුණලා
(2) හිතෛෂීන් - හිතවතුන්, අග්‍රභාගය - මුල් කොටස, විලම්බය - ප්‍රමාදය
(3) පෝෂී - නැති කිරීම, ස්වයං සිද්ධි ජනනය - ඉබේහටගන්නා, වනපොත් - කටපාඩම්
(4) අසරුප්පාය - ගැලපෙන, අටසාලිස් - හතලිස් අටක්, පිඹුර - සැළැස්ම

(18) තද්ධිත පදයක් යෙදී නැති වරණය තෝරන්න
(1) ගමේ කාටත් පිහිට වන ඔහු ගුණවතෙකි.
(2) විල් නැමති අඹුවෝ සූර්යයා නැමති හිමියා දැක ගැනීමට ආශාවෙන් සිටින බවයි.
(3) එතරට සූර්යයා පායා ඇති බවයි.
(4) විලට සූර්යයා අමුත්තකු බවයි.

(19) සමාස පද පමණක් ඇති පද පේලිය තෝරන්න.
(1) බුද්ධිමත්, කවීහු, ලියන, නැටුම් (2) පන්සිල්, තිනෙත්, වනමල්, වත්පිළිවෙත්
(3) ග්‍රාමීය, ඉපැරණි, දක්ෂතා, සුන්දර (4) නූතන, ප්‍රභලතා, ඉසුරුමත්, අන්බල

(20) නිවැරදි අකාරාදි පිළිවෙළට නම් යෙදී ඇති වරණය තෝරන්න.
(1) අකුරැස්ස, ගම්පොල, රාගම, පිළිමතලාව, දංඕවිට
(2) අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, කළුතර, සෙංකඩගලපුර
(3) කුරුණෑගල, කොළඹ, දඹදෙනිය, දඹුල්ල, යාපහුව
(4) මින්නේරිය, අවුකන, පල්ලේගම, බදුල්ල, බෙරගල

- මුලින් යෙදී ඇති ව්‍යාකරණ වර්ගය සඳහා නිවැරදිව උදාහරණයක් දක්වා නැති වරණය තෝරන්න.

(21) (1) ක්‍රියා පද - බලනු, ගොස්, ගසති, නැටිණි
(2) අව්‍යය පද - අවනම්බු, නමුත්, නිබඳ, ප්‍රබල
(3) සමාස පද - සුදුමල, නාගරික, අවගුණ, තිනෙත්
(4) ප්‍රත්‍යාර්ථනාම - විදේශික, බැලීම්, සිල්වත්, අරටු

**(22)** **(1) අන්තඃස්ථ අක්ෂර - ය, ර, ල, ව** **(2) නාසික්‍ය අක්ෂර - ඞ, ඤ, න, ම**
**(3) සඤ්ඤක අක්ෂර - ඟ, ඦ, ඳ, ඹ** **(4) ඌෂ්මා අක්ෂර - ශ, ෂ, ළ, ෆ**

- **අංක 23 -26 තෙක් එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැලපෙන අදහස තෝරන්න.**

**(23)** **ලොකු දෙයක් ලැබුණ විට සුළු දේ අමතක කර දැමීම.**
**(1) මැණික් තිබිය දී බොරළු අහුලන්නාසේ** **(2) මාළිගා තිබිය දී රුප්පාවල වැදහෝනා සේ**
**(3) බත් ඇතිදා කොස් තිත්තලු** **(4) මුකරිකම මුදලිකමටත් ලොකුලු**

**(24)** **ඉතා කලාතුරකින් සිදුවන සිද්ධියක්**
**(1) දවස පුරා වතුර ඇද සවසට කළය බින්දා සේ.** **(2) කලකදි වහලු කලකදි රහ වෙනවාලු.**
**(3) කන කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නා සේ.** **(4) නෙළුම්පතේ ඔත් දියතක් සේ.**

**(25)** **උපකාරයක් පතා ගිය තැනින් විපතක් සිදු වීම.**
**(1) කළහොඳ පස්සෙන් එළවීම.** **(2) පැල් ලැග්ගා ගිනි තැප්පට හිලව් වුණා සේ.**
**(3) වැටෙන්න ගිය මිනිහා තල්ලු කළා සේ.** **(4) වඳින්න ගිය දේවාලේ හිසේ කඩා වැටුනා සේ.**

- **නිවැරදි වාක්‍ය නිර්මානය සඳහා සුදුසු පදය තෝරන්න.**

**(26)** **ශ්‍රී ලංකිකයෝ පෞඪ සංස්කෘතියක උරුමක්කාරයෝ ..........**
**(1) වෙයි.** **(2) වෙති.** **(3) වන්නීය.** **(4) වන්නෙහිය.**

**(27)** **පොරොන්දු වූ පරිදි .......... දින දහයකින්ම වැඩ නිම කළහ.**
**(1) කම්කරුවෙක්** **(2) කම්කරුවන්** **(3) කම්කරුවන් විසින්** **(4) කම්කරුවෝ**

**(28)** **සාහිත්‍යධරයෝ වනාහි ප්‍රඥා ප්‍රදීප .......... වෙති.**
**(1) දල්වන්නෝ** **(2) දල්වන්නෙක්** **(3) දල්වන්නන්** **(4) දල්වන්නෙකු**

**(29)** **දෙමාපියන් විසින් .......... පෝෂණය කෙරෙති.**
**(1) දරුවෝ** **(2) දරුවෙක්** **(3) දරුවන්** **(4) දරුවෙකු**

- **අංක 30 සිට 33 තෙක් එක් එක් වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

**(30)** **විද්‍යාත්මක චින්තනය තුළින් සිදුකෙරෙන්නේ හැකිතාක් සත්‍යම සොයා යෑම බැවින් අසත්‍යයෙන් ඈත් වූ පමණින්ම සත්‍යය අප කරා ලඟාවීම වේගවත් වේ.**
**(1) අසත්‍ය සොයා යාමට විද්‍යාත්මක චින්තනයෙන් සිදුවේ.**
**(2) අසත්‍යයෙන් ඈත් වී සත්‍යය කර යාමට විද්‍යාත්මක චින්තනය ඉවහල් වේ.**
**(3) විද්‍යාත්මක චින්තනය තුළින් සත්‍යයේ හා අසත්‍යයේ වේගය හඳුනාගත හැකිය.**
**(4) සත්‍යම සොයා යෑමය විද්‍යාත්මක චින්තනයේ වේගය බලපයි.**

**(31)** **නිදහස් අධ්‍යාපනය රටක පෙරගමන් කරුවා බව අධිකාරම්තුමාගේ මතයයි.**
**(1) අධිකාරම්තුමා නිදහස් අධ්‍යාපන ක්‍රමය සාර්ථක කර ගැනීමට උදව් කළේය.**
**(2) අධිකාරම්තුමා සාර්ථක ලෙස අධ්‍යාපනය ලබමින් නිදහස් අධ්‍යාපන ක්‍රමයට සාර්ථක ලෙස උරදුන්නේය.**
**(3) රටක දියුණුවට අධ්‍යාපනය ඉවහල්වන බැවින් අධිකාරම්තුමා නිදහස් අධ්‍යාපන සාර්ථක කර ගැනීමට උදව් විය.**
**(4) අධ්‍යාපනය ඉදිරියට ගෙනයාමට නම් රට ඉදිරියට ගෙනයා යුතු බව අධිකාරම්තුමාගේ මතයයි.**

**(32)** **සොබා දහමේ සුපිරි වෙළඳසල වශයෙන් ඉංග්‍රීසි ජාතිකයන් විසින් හඳුන්වනු ලබන පොල් ගස ලෝක ජක සංඛ්‍යාවෙන් පහෙන් එකකට ප්‍රයෝජනවත් වන මහගු වෘක්ෂයකි.**
**(1) ලෝකයෙන් බහුතර ජන සංඛ්‍යාවක් පරිභෝජනය කරන පොල් ගස සොබා දහමේ වටිනා භාණ්ඩයකි.**
**(2) ලෝකයේ සෑහෙන ජනතාවකට ඵලදායක පොල් ගස ලොව වටිනාකම ලත් වෙළඳ භාණ්ඩයකි.**
**(3) ඉංග්‍රීසින් ප්‍රවුඩ ජනතාවෙන් පහෙන් පංගුවක් පමණකට පොල් ගස ප්‍රයෝජනවත්ය.**
**(4) ලොව ඇතැම් ජනතාව පොල් ගස මහගු වෘක්ෂයක් හා සුපිරි වෙළඳසලකි.**

**(33)** මස්වලට වඩා මාළුවල ඇති එක් ප්‍රයෝජනයක් නම් අඩු කැලරි අගයකින් යුක්තවීම නිසා ශරීරයට අත්‍යවශ්‍ය පෝෂ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය පමණක් ඉන් ලැබීමයි.

(1) මස්වලට වඩා මාළු පෝෂ්‍යදායි ආහාරයක් ලෙස සැලකිය හැකිය.
(2) මස්වලට වඩා මාළුවල ඇති එක් ප්‍රයෝජනයක් නම් ශරීරයට අත්‍යවශ්‍ය පෝෂ්‍ය කොටස පමණක් ඉන් ලැබීමයි.
(3) මස්වලට වඩා මාළුවල කැලරි අගය අඩුයි.
(4) මස්වල කැලරි අගය වැඩි හෙයින් පෝෂ්‍ය ගුණය වැඩිය.

- අංක 34 සිට 38 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය අතරින් ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

**(34)** (1) කුරුල්ලන් අහසේ පියාඹති.
(2) පිපාසයෙන් පීඩිත වූ වන සතුන් දිය සොයා ඔබ මොබ සැරිසරති.
(3) වැද්දන් සතුන් මරමින් ජීවත් වෙති.
(4) උයනට වැදුනු වඳුරන් රිසිසේ අඹ එල බුදිති.

**(35)** (1) ගුරුවරයෙකු වශයෙන් ජීවිතය ඇරඹූ සමරනායක මහතා පසුව නීතිඥයෙක් විය.
(2) පන්තියේ සමහරු කියවද් දී ඇතමෙක් ලියූහ.
(3) දක්ෂ ක්‍රීඩකයන් රටට සම්පත් පුද්ගලයන්ය.
(4) නිවසේ සිටි සියලු සාමාජිකයන් ද ශ්‍රමදානයට සහභාගි වූහ.

**(36)** (1) නුඹ මා සමග එකග වන්නෙමි.
(2) පියා හෝ නුඹ හෝ ගමනට සහභාගි වෙති.
(3) දක්ෂ ක්‍රීඩකයන් අප ඉදිරියට පැමිණෙති.
(4) ළමයි හෝ තොපි හෝ වැඩ කරයි.

**(37)** (1) අද දින මාපියන් පාසලට පැමිණෙති'යි මම සිතුවෙමි.
(2) සතුරො පහර දෙති'යි රජතුමා සිතුවේය.
(3) උත්සවය පැමිණි සමහරෙක් ගී ගයමින් නැටුවේය.
(4) අප යුක්තිය ඉටුකරති'යි පියාණෝ සිතුහ.

**(38)** (1) පන්සලේ නායක හාමුදුරුවන් බණ මඩුවට වඩියි.
(2) කලාගාරයේ බොහෝ පේක්ෂකයෝ ඇත.
(3) දරුවන් වනාහි අනාගත ලෝකයේ නායකයන්ය.
(4) විශාඛා තොමෝ සන්සුන්ව ගමන් කරයි.

**(39)** අසක්කුවෙන්, තබුල, ඉයන්තුඩ, ඇහැවීම යන ප්‍රාදේශිය ව්‍යවහරයන්හි අදහස් අනුපිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.

(1) බුලත්, හදිසියෙන්, දේශගුණය, වී පැළ නොවන තත්ත්වයට පත්වීම
(2) හදිසියෙන්, බුලත්, දේශගුණය, වී පැළ නොවන තත්ත්වයට පත්වීම
(3) වී පැළ නොවන තත්ත්වයට පත්වීම, දේශගුණය, හදිසියෙන්, බුලත්
(4) බුලත්, වී පැළ නොවන තත්ත්වයට පත්වීම, දේශගුණය, හදිසියෙන්

**(40)**
- ඒ කුල දූ තොමෝ මට සංග්‍රහ කෙරෙයි.
- මගේ කුඹුරුවලට උන් දැන් ඕන කරන්නේ නැහැ.
- මම දන්නැද්ද හම්බු කොන්න එකා.
- ඔබතුමාගේ ළමා අවදිය පිළිබඳ මතකයක් තියෙනවා ද?

පෙළ පොතේ පාඩම් වලින් උපුටා ගත් ඉහත සඳහන් පාඨයන් ඇතුළත් පාඩම් අනුපිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.

(1) කෙතෙන් සිප්හලට, ලද දෙව් දුවගේ වත, බෙලෙක්, ගරු මර්සලින් ජයකොඩි පියතුමා
(2) ගරු මර්සලින් ජයකොඩි පියතුමා, ලද දෙව් දුවගේ වත , බෙලෙක්, කෙතෙන් සිප්හලට
(3) ලද දෙව් දුවගේ වත, බෙලෙක්, කෙතෙන් සිප්හලට, ගරු මර්සලින්ජයකොඩි පියතුමා
(4) බෙලෙක්, ලද දෙව් දුවගේ වත, කෙතෙන් සිප්හලට, ගරු මර්සලින්ජයකොඩි පියතුමා

The National e-learning Portal by The General Education